# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2074/44– 2018 ජූනි 08 වැනි සිකුරාදා – 2018.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**සී. එන්. විතානාච්චි,**
සභාපති,
ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජුනි මස 07 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, එකී උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II කොටස

මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

*කම්කරුවන්ගේ පන්තිය :*

| | | |
|---|---|---|
| (I) | (අ) වැනි ශ්‍රේණිය<br>(ආ) වැනි ශ්‍රේණිය | මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මසන්නෝ, ඩිසයින් පන්ච් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ, ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලකවරු |
| (II) | වැනි ශ්‍රේණිය | ඇඳුම් කපන්නෝ (අතින්), ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත්වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ, |
| (III) | වැනි ශ්‍රේණිය | හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ, විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු), මහන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ, මැෂින් /අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ |
| (IV) | වැනි ශ්‍රේණිය | රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අසුරන්නෝ,සෙලෝපේන් මලු හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ |
| (V) | වැනි ශ්‍රේණිය | ආධුනිකයන් හා පුහුණුවන්නන් |

ඉහත සඳහන් යම් වෘත්තීය ආධුනිකයෙකුගේ හෝ පුහුණුවන්නකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත විය යුතුය.

වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | I ඒ ශ්‍රේණිය | I බී ශ්‍රේණිය | II ශ්‍රේණිය | III ශ්‍රේණිය | IV ශ්‍රේණිය | V ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1 සේවා වර්ෂය | 14,650.00 | 14,100.00 | 12,700.00 | 12,600.00 | 12,000.00 | 7500.00 |
| 2 සේවා වර්ෂය | 14,850.00 | 14,275.00 | 12,850.00 | 12,725.00 | 12,100.00 | |
| 3 සේවා වර්ෂය | 15,050.00 | 14,450.00 | 13,000.00 | 12,850.00 | 12,200.00 | |
| 4 සේවා වර්ෂය | 15,250.00 | 14,625.00 | 13,150.00 | 12,975.00 | 12,300.00 | |
| 5 සේවා වර්ෂය | 15,450.00 | 14,800.00 | 13,300.00 | 13,100.00 | 10,320.00 | |

06 - 933

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.